සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT**

මගේ අංකය DSD/HO/13/TR/004/පොදු ව.ලේ.
எனது இல ..........................................................
My No

ඔබේ අංකය
உமது இல ..........................................
Your No

දිනය 2019.06.19
திகதி ..........................................
Date

සමෘද්ධි චක්‍රලේඛ අංක :- **2019/09**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

සියළුම සමෘද්ධි කළමණාකරුවන්,

## <u>මානව සම්පත් සංවර්ධන වැඩසටහන - 2019</u>

### 1. හැදින්වීම.

"දුගී බවින් තොර සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම" වන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම සැබෑ කර ගැනීම සඳහා ක්‍රියාකාරීව මැදිහත් වන මානව සම්පත ප්‍රාග්ධනයක් බවට පත්කළ යුතුව ඇත. එබැවින් 2019 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන අංශයේ ඉලක්කය වනුයේ වාර්ෂිකව ප්‍රතිලාභි පවුල් සවිබල ගන්වා සමෘද්ධිමත් ජාතියක් ගොඩනගා ජාතික ආර්ථිකයට දායක කරවීමට වෙර දරන නිළධාරින් ශ්‍රී ලාංකික මානව ප්‍රාග්ධනයක් බවට පත්කරමින් ඔවුන්ට සේවා තෘප්තියක් ලබා දීමයි. මෙම මානව ප්‍රාග්ධනය ඵලදායි ලෙසත්, කාර්යක්ෂම ගති ලක්ෂණ වලින් හා දැනුම ,කුසලතා හා ධනාත්මක ආකල්ප හා සුසමාදර්ශන්ගෙන් සමන්විත වූ කල්හි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ලඟා කර ගැනීමට හැකි වේ. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය මානව ප්‍රාග්ධනයක් බවට පත් කිරීම උදෙසා මානව සම්පත් සංවර්ධන අංශයේ 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඇත. මානව සම්පත් සංවර්ධන අංශයේ සමස්ථ පුහුණු වැඩසටහන තුලින් කාර්යමණ්ඩලය සවිබලගැන්වීමත්, එනම් කාර්යමණ්ඩලයේ දැනුම, කුසලතා, හැකියාවන්, ධනාත්මක ආකල්ප,වටිනාකම,මනෝ රාමුව (සිතුවිලි රාමුව) හා සුසමාදර්ශයන් වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

මේ අනුව 2019 වසර තුළ මෙම දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය නැවත පුහුණු කිරීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන අතර, ඊට අදාළ පුහුණු වැඩසටහන් සාරාංශය පහත පරිදි වේ.

**2019 වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත ක්‍රියාකාරකම් හා කාළ රාමුව.**

| අ.අ. | පුහුණුව | පුහුණු කරන නිළධාරීන් සංඛ්‍යාව | නිමකිරීම ට අපේක්ෂිත දිනය | වැඩි විස්තර සඳහා චක්‍රලේඛයේ ජේද අංකය |
|---|---|---|---|---|
| 1. | ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබා දීම. | නිළධාරීන් 300 | සැප්තැම්බර් 30 ට පෙර | ජේද අංක -2<br>පිටු අංක - 2, 3 |
| 2. | දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබා දීම | දිස්ත්‍රික්කයකට පුහුණු වැඩසටහන් 4 බැගින් නිළධාරීන් 4000 | සැප්තැම්බර් 30 ට පෙර | ජේද අංක -3<br>පිටු අංක -3 |
| 3. | උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යන පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් හට ආධාර ලබා දීම. | නිළධාරීන් 50 | ඉල්ලා සිටින දිනයන්ට අදාලවේ. | ජේද අංක - 4<br>පිටු අංක - 3 ,4 |
| 4. | නිලධාරීන් කෙටි කාලීන විදේශීය අධ්‍යයන චාරිකා හා පුහුණුව සඳහා යොමු කිරීම | නිළධාරීන් 50 | සැප්තැම්බර් 30 ටපෙර | ජේද අංක - 5<br>පිටු අංක - 4 |
| 6. | සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම | 02 | නොවැම්බර් 30ට පෙර | ජේද අංක - 06<br>පිටු අංක - 5 |

## 02. ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය සඳහා විෂයානුබද්ධව පුහුණුව ලබා දීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අධිකාරින් තුනක එකතුවෙන් සැදුම් ලත් බැවින් එම අධිකාරින් තුනේ නිළධාරින් දෙපාර්තමේන්තුවක රාජකාරි කිරීමේදී ආයතනික හා පරිපාලන කටයුතු පිළිබඳව දැනුම කුසලතා හා ධනාත්මක ආකල්පයන්ගෙන් යාවත්කාලීන කළයුතුව ඇත. දෙපාර්තමේන්තුගත සේවකයින් ලෙස දැනුවත් විය යුතු පොදු චක්‍රලේඛ අණ පනත් වලට අමතරව ඔවුන් නියැලෙනු ලබන විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනතාවය හා කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණු කර ගෙන නිළධාරීන්ට මෙම විෂයානුබද්ධ පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත.

### 2.1.මෙම පුහුණුව පහත විෂය ක්ෂේත්‍රයන්ට අදාලව ලබා දිය යුතුවේ.

i. ආයතනික හා පරිපාලන කටයුතු (ආයතන සංග්‍රහය)
ii. කාර්යාල කළමණාකරණය හා 5S ක්‍රමය
iii. මුදල් රෙගුලාසි (මුදල් සංග්‍රහය)
iv. විමර්ශන කටයුතු
v. විගණන කාර්යන්
vi. සමාජ සංවර්ධන, ප්‍රජා මූල සංවිධාන හෝ සංවර්ධන අංශ වලට අදාල පුහුණු

මෙම වැඩසටහන යටතේ පුහුණු කළ යුතු නිලධාරීන් පිළිබඳ තොරතුරු එක් එක් අංශ ප්‍රධානීන් විසින් හඳුනාගෙන මානව සම්පත් සංවර්ධන අංශය වෙත ලබා දිය යුතුය. ඒ ඒ අංශ වල අවශ්‍යතාවය මත මෙම පුහුණු වැඩසටහන් මානව සම්පත් සංවර්ධන අංශය මගින් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලැබේ.

මේ සඳහා වැය ඇස්තමේන්තුව හා පුහුණු අන්තර්ගතය පුහුණුව ලබා දිය යුතු නිලධාරීන්ගේ තොරතුරු ආදී තොරතුරු ඇතුළත් පුහුණු සැලැස්ම දෙවැනි කාර්තුව තුළ සකස් කර මානව සම්පත් සංවර්ධන අංශය වෙත සැපයිය යුතුවේ. මෙම පුහුණුව වසරේ තෙවන කාර්තුව අවසන් වන විට නිම කළ යුතුය.

02.2 හඳුනා ගන්නා ලද විශේෂ පුහුණු වැඩසටහන් උදා-SLIDA, IBSL, IPM, MILODA විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතන හෝ පෞද්ගලික ආයතන වලට යොමු කර ජාතික මට්ටමින් පුහුණුවීම් ලබා දීමට කටයුතු සැළසුම් කරන අවස්ථා වලදී ඒ සඳහා පුහුණුව ලබා දිය යුතු නිලධාරීන් හඳුනාගෙන මානව සම්පත් සංවර්ධන අංශයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.

**3. දිස්ත්‍රික් මට්ටමින් කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව.**

දෙපාර්තමේන්තුගත සේවකයින් ලෙස දැනුවත් විය යුතු පොදු චක්‍රලේඛ අණ පනත් වලට අමතරව තමා නියැලෙනු ලබන විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණතාවය හා කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණු කර ගෙන මෙම විෂයානුබද්ධ පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත.

මේ යටතේ, පරිපාලන හා ආයතන, ගිණුම් හා මූල්‍ය පරිපාලන, විගණන හා විමර්ශණ, ව්‍යවසායකත්ව සංවර්ධන, අලෙවි යන ක්ෂේත්‍ර වලටත්, ක්ෂුද්‍ර මූල්‍යකරණය හා සමෘද්ධි බැංකු ගිණුම් ක්‍රියාවලිය, සමාජ සංවර්ධන, ප්‍රජා මූල සංවිධාන අදාල පුහුණු වැඩසටහන් පැවැත්වීමටත්, සැළසුම් කර ඇත.

මේ සඳහා දිස්ත්‍රික් මට්ටමින් / ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන්ට ලබා දීමට යෝජිත හඳුනාගත් පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන වැඩමුළු සැළසුම් කර ක්‍රියාත්මක කිරීම ඒ ඒ දිස්ත්‍රික් අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම වේ. මේ සඳහා එක් එක් දිස්ත්‍රික් අනුව මෙම **ඇමුණුම් /HR/08** හි පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇත.

විශේෂිත පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමේ දී, එහි තොරතුරු ඇතුලත් සංක්ෂිප්ත පුහුණු සැලැස්ම හා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

**04. උසස් අධ්‍යාපන හා වෘත්තීය සංවර්ධන පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා සමෘද්ධි ජාතික සභාව විසින් අනුමත කරන ලද නිර්නායක වලට අනුව දෙපාර්තමේන්තුවේ මූලික අරමුණට හා අදාල තනතුරේ කාර්යභාරය වඩාත් ඵලදායීව ඉටුකිරීමට ඍජුව දායක වන පාඨමාලා හැදෑරීම සඳහා ගාස්තු ගෙවනු ලැබේ. මේ සඳහා නිළධාරීන් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය සහිතව අයදුම් කර, අදාල ආයතන විසින් තෝරාගෙන ඇති අවස්ථාවල අදාල පාඨමාලා සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු වල රාජ්‍ය නිලධාරීන්ට අදාල වන්නා වූ අනෙකුත් විධිවිධාන වලට යටත්ව පාඨමාලා සඳහා මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරනු ඇත.

4.1. මෙම පාඨමාලා පවත්වනු ලබන ආයතන විශ්ව විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හෝ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතන විය යුතුය.

4.2මේ සඳහා ඉල්ලුම් කරනු ලබන නිලධාරීන් අදාළ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. පාඨමාලා ගාස්තු ඉල්ලා සිටින්නන් පහත ලේඛන පිටපත් 2කින් යුතුව ඉදිරිපත් කල යුතුය.

- ඉල්ලුම් පත්‍රය හා ගිවිසුම් පත්‍රය
- විශ්ව විද්‍යාලය හෝ අධ්‍යාපන ආයතනය මඟින් තෝරාගත් ලිපිය

- ගාස්තු ගෙවූ රිසිට් පත් වල මුල් පිටපත් හා ඡායා පිටපත්
- බැංකු ගිණුමේ පාස් පොතේ පිටපත
- පාඨමාලාව සම්පූර්ණ කර ඇතිනම් සහතික පත්‍රය

පාඨමාලාවට ඉල්ලුම් කිරිම සඳහා අවශ්‍ය වන ඉල්ලුම් පත්‍රය **ඇමුණුම /HR/02** මඟින්ද ඒ සඳහා අවශ්‍යවන ගිවිසුම් පත්‍රය **ඇමුණුම /HR/03** මඟින්ද දක්වා ඇත.

**05. විදේශ ශිෂ්‍යත්ව පාඨමාලා සම්බන්ධීකරණය සහ අත්දැකීම් හුවමාරු අවස්ථා සඳහා නිලධාරින් යොමු කිරීම.**

5.1 දිළිඳු ජනතාව සවිබලගැන්වීම සඳහා කලාපීය රටවල් වල ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් වල අත්දැකීම් ලබා දීමේ අරමුණු ඇතිව කෙටි කාලීන විදේශ සංචාර සඳහා අභ්‍යන්තර කාර්යමණ්ඩලයේ වඩා කැපවීමෙන් සහ උනන්දුවෙන් කටයුතු කරන නිලධාරීන් යොමු කිරීම මෙම වැඩසටහන යටතේ සිදුවේ.

5.2 දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරින් වෙත ප්‍රදානය කරනු ලබන විදේශීය ශිෂ්‍යත්ව පාඨමාලා සම්බන්ධයෙන් දිස්ත්‍රික් / ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මඟින් සිදු වේ. අදාළ ශිෂ්‍යත්වයේ සඳහන් සුදුසුකම් සහ නිර්ණායක අනුව සුදුසු නිළධාරීන් අයදුම් කළ යුතු අතර අයදුම්පත් වල පිටපත් ආයතන ප්‍රධානියා මඟින් පිටපත් 03 කින් යුතුව මානව සම්පත් සංවර්ධන අංශය වෙත යොමු කළ යුතුය.

5.3 මීට අමතරව අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි පත් කරන ලද මානව සම්පත් සංවර්ධන කමිටුව මඟින් විදේශ ශිෂ්‍යත්ව ලබා දීම සඳහා සියළුම දිස්ත්‍රික් /අංශ නියෝජනය කරමින් සකස් කොට ඇති ප්‍රමුඛතා ලේඛණය මඟින් සුදුසු නිළධාරීන් තෝරා යොමු කරනු ලැබේ.

**06. පුහුණු මධ්‍යස්ථාන විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම.**

6.1.සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීයව පිහිටුවා ඇති පුහුණු මධ්‍යස්ථාන, කාර්ය මණ්ඩල පුහුණුව සඳහා භාවිතා කිරීමට සහ රජයේ සහ පෞද්ගලික අංශ වලට අවශ්‍ය පහසුකම් ලබාදීමත්, එමගින් පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනයට මග පෙන්වා දීමටත් කටයුතු කරනු ලැබේ.

6.2. පහත සඳහන් මධ්‍යස්ථාන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ජාතික පුහුණු මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මකවේ.

බලංගොඩ - සමනලවැව පුහුණු මධ්‍යස්ථානය - 045 - 3499821

පේරාදෙණිය -නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය - 081 - 2067215

ත්‍රිකුණාමලය - නිලාවෙලි සමෘද්ධි මධ්‍යස්ථානය - 026 - 2232335

6.3. දිස්ත්‍රික් මට්ටමින් ඉහත මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ස්ථානභාර නිලධාරීන් සමග සාකච්ඡා කර, ඇස්තමේන්තු සකස් කිරීම හා සැලසුම් කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

6.4. එලෙසම, මෙම මධ්‍යස්ථාන පුහුණු කටයුතු සඳහා වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීම අපේක්ෂා කරන බැවින් ඔබ දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු වැඩසටහන් මෙම මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට ප්‍රචාරණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වනු ඇත.

6.5. එමෙන්ම, පුහුණු මධ්‍යස්ථාන සඳහා නිකුත් කරන ලද මූල්‍ය හා පරිපාලන චක්‍රලේඛ උපදෙස් මත මධ්‍යස්ථානභාර නිළධාරීන් කටයුතු කළ යුතු අතර, මධ්‍යස්ථානයේ පහසුකම් බාහිර පාර්ශව වලට ලබා දීමේ විධිමත් වැඩපිළිවෙලක් අනුව ආදායම් උත්පාදනය කිරීමටත් මධ්යස්ථාන භාර නිලධාරින් කටයුතු කළ යුතුය.

6.6. ඉහත පුහුණු මධ්‍යස්ථාන වල කාර්තුමය ප්‍රගතිය, මධ්‍යස්ථානභාර නිලධාරීන් විසින් මානව සම්පත් සංවර්ධන අංශයට ත්‍රෛමාසිකව ඉදිරිපත් කළ යුතුය

## 07. ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන පුහුණු වැඩසටහන්.

| අ.අ. | පුහුණුව | පුහුණු කරන නිළධාරීන් සංඛ්‍යාව | නිමකිරීම ට අපේක්ෂිත දිනය | වැඩි විස්තර සඳහා චක්‍රලේඛයේ ඡේද අංකය |
|---|---|---|---|---|
| 1. | ක්ෂුද්‍ර මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව | නිලධාරීන් 250 | සැප්තැම්බර් 30 ට පෙර | ඡේද අංක - 7.1<br>පිටු අංක - 5,6 |
| 2. | නායකත්ව කුසලතා සහ ආකල්ප සංවර්ධන තුළින් නිළධාරීන්ගේ අභිප්‍රේරණය ඉහළ නැංවීම. | නිලධාරීන් 200 | සැප්තැම්බර් 30 ට පෙර | ඡේද අංක - 07.03<br>පිටු අංක - 7 |
| 3. | සමෘද්ධි ගෘහ ඒකක ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව | දිස්ත්‍රික්කයකට 4 බැගින් වැඩසටහන් 100 නිලධාරීන් 6000 | සැප්තැම්බර් 30 ටපෙර | ඡේද අංක - 7.4<br>පිටු අංක - 7,8 |
| 4. | සමෘද්ධි ප්‍රජා මූල බැංකු බැංකු කාර්ය මණ්ඩලය සඳහා පාරිභෝගික සත්කාරය පුහුණු වැඩසටහන. | නිලධාරීන් 2500 | ඉල්ලා සිටින දිනයන්ට අදාල වේ. | ඡේද අංක - 07.02<br>පිටු අංක - 8,9 |

දිළිඳුකම පිටු දැකීමේ අරමුණින් ක්‍රියාත්මක සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය බැංකු මඟින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී තෘප්තිමත් සේවයක් සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත ලබා දීම සඳහා බැංකු කටයුතු නව්‍යකරණයෙන් යුතුව ආකර්ශණීය ලෙස පවත්වා ගෙන යා යුතුය. මේ සඳහා නියැලී සිටින දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ හැකියාවන් නිපුණතාවයන් වර්ධනය කරමින් ඔවුන් ශක්තිමත් කළ යුතුය. එමෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය බැංකු වල ලාභාංශ වැඩි කර එමඟින් දිළිඳු ජනතාව වෙත ලබා දෙන ප්‍රතිලාභ වැඩි කිරීම සඳහා සේවක ඵලදායීතාවය ඉහළ නැංවීමට නිළධාරීන් දැනුවත් කළ යුතුය.
ඒ අනුව නිළධාරීන්ට නව දැනුම ලබා දීම සඳහා සහ පවත්නා දැනුම යාවත්කාලීන කිරීම සඳහා බැංකු කාර්ය මණ්ඩලය සහ සියළු ක්ෂේත්‍ර නිළධාරීන් නියෝජනය වන පරිදි පුහුණු වැඩසටහන් පවත්වන ලෙස සමෘද්ධි ජාතික සභාව විසින් දී ඇති උපදෙස් අනුව පහත සඳහන් විෂයන් 04 යටතේ පුහුණු වැඩසටහන් පැවත්වනු ලැබේ.

<u>ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක පුහුණු වැඩසටහන්</u>

01. ක්ෂුද්‍ර මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව.

02. සමෘද්ධි ප්‍රජා මූල බැංකු කාර්ය මණ්ඩලය සඳහා පාරිභෝගික සත්කාරය පිළිබඳ පුහුණුව.

03.ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව

04.නායකත්ව සහ ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන

### 07.1ක්ෂුද්‍ර මූල්‍යය සහතික පත්‍ර පාඨමාලාව.

දිළිඳුකම පිටු දැකීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන වැඩසටහන් අතරින් ප්‍රමුඛතම කාර්යභාරයක් සිදු වනුයේ සමෘද්ධි බැංකු අංශය මඟිනි. එබැවින් එම කාර්යේ නියැලී සිටින සමෘද්ධි කාර්ය මණ්ඩලය ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳව හා එම න්‍යායාත්මක කරුණු පිළිබඳව මනා අවබෝධයකින්

යුක්ත විය යුතුය. වඩා නිවැරදි කාර්යක්ෂම සේවයක් ලබා දීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ක්‍රියාවලිය පිළිබඳව දැනුම ලබා දිය යුතුය. මෙහි මූලික අදියර යටතේ මෙම වසරේ මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්ෂුද්‍ර මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව හදාරා නොමැති කාර්ය මණ්ඩලයේ 250 දෙනෙකුට ක්ෂුද්‍ර මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීමට සැළසුම් කර ඇත.

### 7.1.1වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය.

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතය (IBSL) ආයතනය මඟින් ලබා දීමට කටයුතු කරනු ලැබේ. පහත සඳහන් කරුණු ඇතුළත්ව ක්ෂුද්‍ර මූල්‍ය සහතික පත්‍ර පුහුණුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් පුහුණු මධ්‍යස්ථාන වලදී පැවැත්වනු ලැබේ. පාඨමාලා කාළය දින 05 ක් වන අතර, අවසන් ඇගයීම පවත්වන දින සමඟ පුහුණු කාළය දින 06 කි. මෙම පාඨමාලා නේවාසිකව පැවැත්වීමට කටයුතු සැළසුම් කර ඇත.
ක්ෂුද්‍ර මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව හැදැරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයේ අධ්‍යක්ෂක දැනුවත් කර වඩාත් සුදුසුම නිළධාරීන් ඇමුණුමේ සඳහන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් හඳුනා ගෙන ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් අංශය වෙත යොමු කිරීමට දිස්ත්‍රික් අධ්‍යක්ෂකවරුන් විසින් කටයුතු කළ යුතුය.
ඉන් අනතුරුව මෙම පාඨමාලා පවත්වනු ලැබේ.

<u>පුහුණු අන්තර්ගතය</u>

- ක්ෂුද්‍ර මූල්‍ය සහ සමාජ ආර්ථික වගකීම් නිර්වචනය.
- ක්ෂුද්‍ර මූල්‍ය කර්මාන්තයේ ගෝලීය සංවර්ධනය.
- ආසියානු කලාපීය රටවල ක්ෂුද්‍ර මූල්‍ය ආකෘති.
- ශ්‍රී ලංකා ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමවේදයේ සිද්ධි අධ්‍යනයන් හා සාර්ථක අත්දැකීම්.
- ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල අධිකාරීත්වය හා කළමණාකරන පිළිබඳ සාර්ථක අත්දැකීම්.
- ක්ෂුද්‍ර මූල්‍ය පනත හා එහි වැදගත්කම.

### 07.02. පාරිභෝගික සත්කාරය පිළිබඳ සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම.

වඩාත් ගුණාත්මක සේවාවක් තම ප්‍රතිලාභීන් ගනුදෙනුකරුවන් වෙත ලබා දීම සඳහා අපගේ බැංකු කාර්ය මණ්ඩලය ඉතාමත් සුහදශීලී විය යුතුය. ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන් සෑහීමකට පත් විය යුතුය. එමෙන්ම කාර්යක්ෂමව තම කාර්ය කරගෙන යාම සඳහා කාර්යාල පරිසරය සකස් විය යුතු වේ.
තම සේවා දායකයින් වෙත සුහදශීලීව හා ඔවුන්ගේ සිත සතුටු වන ආකාරයට තම සේවාව ලබා දීමේදී අනුගමනය කළ යුතු පිළිවෙත් කවරේද යන්න පිළිබඳව මෑත කාළයේදී අපගේ කාර්ය මණ්ඩලය දැනුවත් කර නැත. එබැවින් පාරිභෝගික සත්කාරය පිළිබඳ මනා පළපුරුදු උපදේශකවරුන් ලවා පහත සඳහන් කරුණු ඇතුළත් පුහුණුව ප්‍රාදේශීය මට්ටමේ නිළධාරීන්ට ලබා දීම සඳහා මෙම පුහුණුව සැළසුම් කර ඇත. මෙම පුහුණුව පහත සඳහන් කරුණු අන්තර් ගත වන පරිදි පැවැත්වනු ලැබේ.

- පාරිභෝගිකයා හැඳින්වීම.
- වඩාත් ගුණාත්මක පාරිභෝගික සත්කාරයක් දිය හැක්කේ කෙසේද?
- ඵලදායී ආකාරයට ගැටළු නිරාකරණය කිරීම.
- යහපත් පාරිභෝගික සත්කාරයක් සඳහා හැකියාවන් වර්ධනය කිරීම.
- වඩා යහපත් කාර්යාල පරිසරය

### 7.2.1 පුහුණුව පවත්වන ආකාරය

දිස්ත්‍රික්කයේ පිහිටි සියළුම බැංකු නියෝජනය වන පරිදි සමෘද්ධි බැංකු රාජකාරී සඳහා සක්‍රීයව සහභාගී වන නිළධාරීන් අතරින් පුහුණුව ලබා දිය යුතු නිළධාරීන් තෝරා ගැනීම දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ වගකීම වේ. මේ සඳහා නිළධාරීන් තෝරා ගැනීමේදී ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අධ්‍යක්ෂකගේද නිර්දේශ ලබා ගැනීම සුදුසු වේ.

මෙය එක් දින පුහුණු වැඩසටහනක් වන අතර එක් එක් දිස්ත්‍රික් වලට අදාළ නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන වඩාත් පහසු ස්ථාන තෝරා ගෙන පුහුණු වැඩමුළු පැවැත්වීමට දිස්ත්‍රික් අධ්‍යක්ෂ කටයුතු කළ යුතුය. මෙම පාඨමාලාව ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ප්‍රතිපාදන වැය කරමින් පවත්වනු ලබන අතර ඇමුණුමේ සඳහන් ප්‍රතිපාදන දිස්ත්‍රික් කාර්යාල වෙත නිදහස් කරනු ඇත.

මේ සඳහා සුදුසු උපදේශකයින් තෝරා දීම ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය මඟින් කරනු ලැබේ.

### 07.03 නායකත්ව කුසලතා සහ ආකල්ප සංවර්ධන තුළින් නිළධාරීන්ගේ අභිප්‍රේරණය ඉහළ නැංවීම.

මෙම පුහුණුව තුලින් වැඩ පරිසරයේ ආතතියෙන් මිදීම අරමුණු කරන අතර මේ තුලින් භාවමය බුද්ධිය අවධි කර කණ්ඩායම් හැඟීම් වර්ධනය කර ධනාත්මක චින්තනයක් සහිත කාර්‍යක්ෂම සේවාවක් සැපයිය හැකි වන පරිදි නිළධාරින්ගේ ආකල්ප වර්ධනය කිරිම මුඛ්‍ය අරමුණ වේ.

මෙම වැඩ සටහන ප්‍රධාන කාර්‍යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය මගින් සංවිධානය කරනු ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව තෝරා ගන්නා ලද පුහුණු මධ්‍යස්ථානයක මෙම පුහුණුව පැවැත්වීමට කටයුතු කරනු ලැබේ..මෙම වැඩසටහන ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනු ලැබේ.

පාඨමාලා කාළය දින 02 ක් වන අතර, මෙම පාඨමාලා නේවාසිකව පැවැත්වීමට කටයුතු සැළසුම් කර ඇත.සුදුසු නිළධාරීන් දිස්ත්‍රික් මට්ටමින් හඳුනා ගෙන ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් අංශය වෙත යොමු කිරීමට දිස්ත්‍රික් අධ්‍යක්ෂකවරුන් විසින් කළ යුතුය.

මේ යටතේ,

- අභියෝග වලට මුහුණ දීම.
- තීරණ ගැනීම.
- ආකල්ප සංවර්ධනය.
- කාර්යඵල සංවර්ධනය.
- ආතති කළමණාකරණය.
- භාවමය බුද්ධිය.
- යන මාතෘකා සම්බන්ධව පුහුණුව ලබා දිම අපේක්ෂා කෙරේ.

### 7.4. ආර්ථික සවිබලගැන්වීම උදෙසා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු පාඨමාලාව.

සමෘද්ධි බැංකු පද්ධතිය ලාභදායි කිරීම හා එම බැංකු ඵලදායි හා කාර්යක්ෂම කිරීම මානව සම්පත් සංවර්ධන අංශයේ අරමුණවේ. සමෘද්ධි බැංකු හරහා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ව්‍යාපෘති ණය ලබා

දුන්නද ව්‍යාපෘති අවශ්‍යතා හඳුනා ගැනීමත්, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු වල දුර්වලතාවයන් නිසා අසාර්ථක කුඩා ව්‍යාපාර වැඩි වී ඇති අතර ණය පැහැරහැරීම්ද වැඩි වීඇත. එබැවින් මෙම පාඨමාලාව මගින් මෙම තත්වයන් මඟහරවා ගැනීම අපේක්ෂා කරයි.

මේ යටතේ,

- ව්‍යවසායකයා හා කුඩා ව්‍යවසායකයා හඳුනා ගැනීම,
- ව්‍යවසායක අත්දැකීම් විග්‍රහ කිරීම ,
- කුඩා ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටළු හා ව්‍යවසායක ඵලදායීතාවයට බලපාන මූලික සාධක හා එම සාධක කෙරෙහි බලපාන කරුණු විග්‍රහ කිරීම,
- ව්‍යවසායකත්ව සංවර්ධනයට සේවා පහසුකම් ළඟා කර ගත හැකි ආයතන,
- ව්‍යවසායකයෙකු වර්ධනය කර ගත යුතු යහපත් ආකල්ප.
- නිෂ්පාදන ගුණාත්මක භාවයෙහි වැදගත්කම හා වර්ධනය කිරීමේ උපක්‍රම,ව්‍යවසායක ඵලදායිතා සංවර්ධන වැඩ සැළසුම යන මාතෘකා සම්බන්ධව දැනුම ලබා දීමට අපේක්ෂා කෙරේ.

**<u>පුහුණු පාඨමාලා ක්‍රියාත්මක වන ආකාරය.</u>**

මෙම පුහුණුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලය මඟින් පවත්වනු ලැබේ. මෙම විෂය සම්බන්ධයෙන් විශේෂ දැනුමැති ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය පුහුණුකරු සංචිතයේ සම්පත් දායකයින් විසින් අපගේ ක්ෂේත්‍ර නිළධාරීන් ඉහත කරුණු යටතේ දැනුවත් කරනු ලැබේ.

මෙය එක් දින පුහුණු වැඩසටහනක් ලෙස සංවිධානය කරන අතර, පුහුණුව සඳහා වැයවන සම්පත් දායක දීමනා, සහභාගීවන්නන් සඳහා ආහාර පාන සහ ලිපිද්‍රව්‍ය සහ සම්පත්දායක දීමනා ඇතුළු අනෙකුත් වියදම් ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් දරනු ලැබේ.

මෙම පුහුණුව ලබා දිය යුතු නිළධාරීන් හඳුනා ගැනීම දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ වගකීම වේ. එසේ හඳුනා ගන්නා ලද නිළධාරීන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ (එම දිස්ත්‍රික්කයට අදාළ) ප්‍රාදේශීය කාර්යාලය සම්බන්ධීකරණය කොට මෙම පුහුණු වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නියෝජනය වන පරිදි පැවැත්වීම දිස්ත්‍රික් අධ්‍යක්ෂක විසින් කළ යුතුය. මේ සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල කළමණාකරුවන් දැනුවත් කිරීම ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය මඟින් කරනු ලැබේ.

## 8. පුහුණු වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන.

2019 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත ක්‍රියාත්මක සැලැස්මට අනුව අභ්‍යන්තර කාර්යමණ්ඩල පුහුණුව සඳහා වෙන්වී ඇති භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් සහ ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ප්‍රතිපාදන වලින් පුහුණු වැඩසටහන් සඳහා මුදල් වැයකරනු ලැබේ. දිස්ත්‍රික් පුහුණු වැඩසටහන් වලට අවශ්‍ය ප්‍රතිපාදන චක්‍ර ලේඛයේ ඇමුණුම් **HR/08** හි සඳහන් පරිදි වෙන්කර ඇත.

ඒ අනුව දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගන්නා පුහුණු වැඩසටහන් වලට අවශ්‍ය මුදල් ඒ ඒ දිස්ත්‍රික් වෙත අභ්‍යන්තර කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වෙන් කළ ප්‍රතිපාදන යොදා ගත යුතුය.

## 9. ප්‍රගති සමාලෝචනය.

9.1 මානව සම්පත් සංවර්ධන අංශයට අදාල කාර්යයන් පිළිබඳව ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම ඉතා වැදගත් කාර්යයක් වන බැවින් එම කාර්යය පහත සඳහන් පරිදි සංවිධානය කළ යුතුය.

| **ප්‍රගති සමාලෝචන මට්ටම** | **යෝජිත කාල පරාසය** | **මෙහෙයුම් වගකීම** |
|---|---|---|
| ප්‍රාදේශීය මට්ටම | මසකට වරක් - සමාන්‍ය ප්‍රගති සමාලෝචනයේ එක් විෂයක් ලෙස | ප්‍රාදේශීය ලේකම්,මූලස්ථාන කලමණාකරු |
| දිස්ත්‍රික් මට්ටම | දෙමසකට වරක් | දිස්ත්‍රික් අධ්‍යක්ෂ, දිස්ත්‍රික් පුහුණු විෂයභාර කලමණාකරු |
| පුහුණු මධ්‍යස්ථාන මට්ටම | මසකට වරක් | ස්ථාන භාර නිලධාරී |
| ජාතික මට්ටම | තෙමසකට වරක් | අධ්‍යක්ෂ මානව සම්පත්(මානව සම්පත් සංවර්ධන අංශය) |

9.2 පුහුණු මධ්‍යස්ථාන වල ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් වල මාසික ප්‍රගතියත්, පුහුණු මධ්‍යස්ථානවල කුඩා ව්‍යාපෘති මගින් ලැබෙන ආදායම් ප්‍රගතියත් **ඇමුණුම HR/04** හා **ඇමුණුම HR/05** අනුව සකස් කර, සෑම මසකම 10 වන දිනට පෙර මානව සම්පත් සංවර්ධන අංශයට ලබා දීමට කටයුතු කළ යුතුවේ.

9.3 මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්යයන් දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම සඳහා කළමනාකරුවකු අනුයුක්ත කළ යුතු අතර, එමගින් මෙම කාර්යය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකර ගත හැකිවනු ඇත.

9.4 මූල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික්කයට ලැබීමෙන් අනතුරුව එහි ප්‍රගතිය **ඇමුණුම HR/06** අනුවත් , මූල්‍ය ප්‍රතිපාදන ප්‍රාදේශීය මට්ටමට ලැබීමෙන් අනතුරුව එහි ප්‍රගතිය **ඇමුණුම HR/07** අනුව දිස්ත්‍රික්කයට පිටපත් සහිතව සෑම මසකම 10 වන දිනට පෙර ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශයට එවිය යුතුය.

## 10. අධීක්ෂණය හා පසු විපරම් කටයුතු.

10.1 මානව සම්පත් සංවර්ධන අංශයේ සිදුකරනු ලබන සෑම පුහුණු වැඩසටහනකම දිස්ත්‍රික් අධීක්ෂණය, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ වගකීම වේ. පසු විපරම් කටයුතු මානව සම්පත් විෂය භාර කළමණාකරු විසින් නිරන්තරයෙන් සිදුකල යුතුය. දිස්ත්‍රික්කයට මූල්‍ය ප්‍රතිපාදන ලද විගස ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට ප්‍රතිපාදන නිදහස් කළ යුතුය. දෙවන, තෙවන කාර්තුවට පෙර වැඩසටහන් සිදුවන්නේද යන්න පසු විපරම් කළ යුතුය.

10.2 2019 වර්ෂයේ ඔක්තෝම්බර් වන විට සියළු පුහුණු වැඩසටහන් අවසන් විය යුතු අතර, දිස්ත්‍රික්කයේ අමතර මුදල් ඉතිරිව තිබේනම් ඔක්තොම්බර් 30ට පෙර අධ්‍යක්ෂ, (මානව සම්පත් සංවර්ධන අංශය) වෙත දැනුවත් කොට ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය වෙත එවිය යුතුය.

## 11 පොදු උපදෙස්.

11.1. මානව සම්පත් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා වන වියදම් රාජ්‍ය මූල්‍ය පරිපාලන චක්‍රලේඛ හා දෙපාර්තමේන්තුවේ මුදල් අංශය විසින් නිකුත් කරණු ලබන මූල්‍ය උපදෙස් වලට අනුකූල විය යුතුය.

11.2 පුහුණු පාඨමාලා හැදෑරීම පිළිබඳව අදාල නීතිරීති හා රාජ්‍ය පරිපාලන ආයතන සංග්‍රහය ආදී වූ රාජ්‍ය දෙපාර්තමේන්තුවක සේවකයන්ට බලපාන නීති රෙගුලාසි අදාල වන්නේය.

11.3 දිස්ත්‍රික් මට්ටමින් හදුනාගත් පුහුණු පාඨමාලා හැකි සෑම අවස්ථාවකදීම මෙම දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථානවලට ප්‍රමුඛතාවය දී එම මධ්‍යස්ථාන වල පැවැත්වීමට කටයුතු කළ යුතු අතර වැඩසටහන් සංවිධානය කිරීමේ දී එම මධ්‍යස්ථාන සමඟ නිසි සම්බන්ධීකරණයක් සහිතව සැලසුම් කළ යුතු වේ.

11.4 පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් යොදා ගැනීමේ දී මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර, ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්ට අදාල ඒ ඒ සංචිතයේ පුහුණුකරුවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

11.5 එක් එක් විෂය ක්ෂේත්‍රය පිළබඳව විශේෂඥ දැනුමක් සහිත සම්පත්දායකයින් අවශ්‍ය වන අවස්ථාවලදී දෙපාර්තමේන්තුවෙහි අදාල සුදුසුකම් සපුරා ඇති සම්පත්දායකයින් නොමැති නම් එම විෂය ක්ෂේත්‍ර සඳහා බාහිර විශේෂඥ සම්පත්දායකයින් යොදවා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

11.6 විශේෂඥ සම්පත්දායකයන් හා දෙපාර්තමේන්තු සම්පත්දායකයන් අදාල කාර්යයන් සඳහා යොදවා ගැනීම පහසුවීම පිණිස ඔවුන්ගේ පුහුණු සුදුසුකම් ද ඇතුලත් යාවත්කාලීන දත්ත පද්ධතියක් මානව සම්පත් සංවර්ධන අංශයට අමතරව, දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලද පවත්වාගෙන යා යුතුය.

ඉහත සඳහන් උපදෙස් හා හා මඟපෙන්වීම් අනුව කටයුතු කර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ ඉහළ විනයක් හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් බිහි කිරීමට දායක වී දෙපාර්තමේන්තුවේ අරමුණු කරා ළඟා වීම අප සැමගේ වගකීම සහ යුතුකම බවද ඔබ වෙත දක්වනු කැමැත්තෙමි.

**එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී බණ්ඩාර**
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**පිටපත්:**

1. **ලේකම්, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස**
2. **විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස**
3. **ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස**
4. **ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස**
5. **සියළුම අංශ ප්‍රධානින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස**